# 6 වන පරිශිෂ්ටය

## තාවකාලික පදනමේ පත්වීමේ ලිපියක අඩංගු විය යුතු මූලික කරුණු

i. සේවකයාගේ නම හා ලිපිනය

ii. තනතුරේ නම

iii. තාවකාලික පදනම මත පත් කෙරෙන දිනය

iv. පත්කරනු ලබන කාලසීමාව (උපරිම කාලය මාස 06කි.)

v. වැටුප් ගෙවන කාල පදනම (දිනකට/ මසකට වැටුප)

vi. සේවක අර්ථසාධක අරමුදල් / සේවක භාරකාර අරමුදල් දායකත්වය

vii. සමිතියේ පරිපාලන විධිවිධාන වලට සහ සමූපකාර සේවක කොමිෂන් සභා ආයතන සංග්‍රහය හා විධිවිධාන වලටද කලින් කල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනවනු ලබන විධිවිධාන හා රෙගුලාසි වලටද යටත්විය යුතු බව.

viii. මෙම පත්වීම් ලැබීම හේතුකොට ගෙන සමිතියේ කිසියම් ස්ථිර තනතුරක් ලබා ගැනීමට කිසිදු අයිතිවාසිකමක් හෝ ස්ථිර පත්කිරීමක් සඳහා වැඩි සැලකිල්ලක් ලබා ගැනීමේ අයිතිවාසිකමක් හෝ පත්වීම් ලාභියාට නොමැති බව දන්වා සිටීම.

ix. ස්ථිර සේවකයෙකුට ලැබෙන සේවා වරප්‍රසාද අනියම් තනතුර සඳහා හිමි නොවන බවත්, එවැනි වරප්‍රසාද සඳහා ඉල්ලුම්කිරීම හෝ බලපෑම් කිරීම අනියම් තනතුර නතර කිරීමට හේතුවක් වන බව.